සන්නස
SANNASA




රජය සතු ඉඩම් ජනතාව අතර බෙදා
දී ගොවි ජනපද පිහිටුවිය. ගල් ඔය,
මිනිපේ, මින්නේරිය, හිගුරක්ගොඩ,
පොළොන්නරුව, ඇලහැර සහ පදවිය
වැනි ප්‍රදේශ වල පිහිටි ජනපද වලට
ඉඩම් අහිමි ගොවි ජනතාව ඇදී එන්නට
විය. පුංචි බණ්ඩේද තම ගම හැර තම
දරු පවුලත් සමග මින්නේරි ජනපදයට
ගියේය. තමා ලත් ඉඩම කැලෑ කපා
කොටා ගිනි තබා හේනක් සකස්කර ගත්
අතර වී වගාව සඳහා කුඹුරක් ද සකසා
ගත්තේය. ඔහුත් බිරිඳත් දැඩි
කැපවීමකින් වෙහෙස නොතකා නොබලා
වැඩ කළ නිසා ගොඩ මඩ ඉඩම් වලින්
සරු අස්වැන්නක් නෙලා ගත්හ. ඒවා
මිලකර ඉහළ ආදායමක් ලබා ගැනීමට
වාසනාවන්තයෝ වූහ. තම පුතුන් දෙ
දෙනාද අකුරු කරන්නට යැවූ අතර ලද
මුදල වැයකර කුඩා කඩයක් සාදා එය
රාමන් නමැති ද්‍රවිඩ පුද්ගල
යෙකුට කුලියට දුන්නේය. රාමන්
උස මහත මැදිවියේ සිටි හිත හොඳ
තැනැත්තෙකි. ඔහු ජනපදයට
ආගන්තුකයෙක් වුවත් ජනපදවාසි
සිංහල මිනිස්සු සමග සමගියෙන් සහජී
වනයෙන් වැඩ කිරීමට දක්ෂයෙක් විය.
මේ අතර අරනෝලිස් නමැති සිල්ලර
වෙළෙන්දා රාමන්ට දෙව්දත් කෙනෙක්
විය. රාමන්ගේ කඩය නිසා
අරනෝලිස්ගේ කඩයේ වෙළඳාම අඩුවිය.
එය අරනෝලිස්ට බලවත් තර්ජනයක්
බව දැනින. පුංචිබණ්ඩේගේ පවුලත්
රාමන්ගේ පවුලත් එකම දම්වැලක ඇති
පුරුක් දෙකක් මෙන්ය. දෙපිරිස දුක
සැප සමව බෙදා හදා ගෙන දිවි ගෙ
වුවෝය. රාමන්ගේ දරුවනුත් පුංචිබන්ෙ
ඩිගේ දරුවනුත් එක කුස උපන් සහෝද
සහෝදරියන් වැන්න. රඝුත් නීතාත්
පන්සලට ගිය අතර නිමලුත් කමලුත්
කෝවිලට ගියේ කිසිම වාද භේදයක්
නැතුවය. ජනපදයේ පාසලට ගිය ඔවුන්
අතර රඝු ඉගෙනීමේ අති දක්ෂයෙක්
විය. ජනපද වාසින් මින්නේරි දෙවියෝ
මහත් භක්තියෙන් හා විශ්වාසයෙන්
ඇදහූහ. ඕනම කටයුත්තකදී දෙවියන්ට
භාර හාර පැවැත්වීම ඔවුන් සිරිතක්
වශයෙන් කළෝය. රාමන් ශිව දෙවියෝ
මෙන්ම මින්නේරි දෙවියෝත් ඇදහුවේය.
ඔහු සිංහල මිනිසෙක් මෙන් ජීවත් විය.
ඔහු ණයට බඩු දුන්නත් කිසිම විටෙක
ණය මුදල වෙනුවෙන්
පොලියක් නොගත්තේය. ඉතා උසස්
මානවීය ගුණ දහමින් පොහොසත් නිසා
ඔහු ජනප්‍රිය පුද්ගලයෙක් විය.

පුංචිබණ්ඩේගේ වැඩිමහල් පුතු කමල්''
සීතා කෙරෙහි විශේෂ ලැදිකමකින් පසු
වුවේය. සීතා ඉතා සුරූපීය. නීල වර්ණ
ඝන දිගු කේශ කලාපයක්ද නෙලුමක
පැහැය ගත් දෙකම්මුලද කෙසඟ
සිරුරද සිහින් ඉගටියද නිල්මිණි පරදන
නෙත් සඟලද ඇගේ රූපය ඔප් නැං
වීමට සමත් විය. ඇගේ රුව නෙත්කලු
වුවා මෙන්ම කටහඬද කන්කලුය.
සිංහල, හින්දි සිංදු කිඳුරු හඬින්
ගැයුවාය. ඈ ඕනෑම නාඹර තරුණ
සිතක් ඇඳ බැඳ ගැනීමට සමත්වූ
වාය. දෙදෙනාගේ ප්‍රේමනීය බැඳීම
ගැන පුංචිබණ්ඩේ දැන සිටියත් ඔහු
එයට විරෝධයක් පෑවේ නැත. ඒ නිසා
සීතාගේත් කමල්ගේත් ආදරය ගලා යන
නදියක් මෙන් ඉදිරියට ඇදී ගියේය.
සැනෙකින් සුළි සුළඟක් හමා ආවා මෙන්
දෙමළ සිංහල ජාතිවාදී අරගලයක් පැන
නැගුනි. සිංහල මිනිස්සු දෙමළ කඩ
සාප්පු ගෙවල් දොරවල් ගිනිබත්
කරන්නට වූහ. අහිංසක ද්‍රවිඩ වැසිය
න්ට විවිධ වද හිංසා දී මරණයට පත්
කලෝය. කිසිවෙකුට අබමල් රේණුවක
තරම්වත් වරදක් නොකල රාමන්ගේ
පවුලටද ජනපදයෙන් වහා පිටවෙන
ලෙස දාමරිකයන්ගෙන් අණ ලැබින.
එසේ නොගියොත් මරණ තර්ජන
නිවේදන කර තිබින. අහිංසක රාමන්ගේ
පවුල නුල කැඩී ගිය සරුංගලයක් මෙන්
අසරණවූහ. පුංචිබණ්ඩේගේ පවුලට
දරාගත නොහැකි ශෝකයක් වුන
රාමන්ගේ නෑදෑයෙක් හිතවතෙක් මේ
හදිස්සියේ සොයා ගත නොහැකි විය.
ඔවුන්ට රැකවරණ දීමට සෙසු සිංහල
මිනිස්සුද බියවුනහ. රාමන්ගේ සුහද මිතු
රෝ හඬා වැළපෙද්දී රාමන් සිය පවුලත්
සමග මහ රෑ ජනපදයෙන් පිටවුයේ
යාමට නිත්‍ය ස්ථානයක් නැතුවය. සිංහළ
රියදුරෙක් වු මාටින් ඒ පිරිස තම
රථයෙන් කොළඹ බලා ගමන් කරන
බසයකට නැංවීය. රාමන් ඇතුළු ඔහුගේ
පවුලේ සැමට ජනපදයෙන් පිටවීමට
සිදුවීම බලවත් දුකකට හේතුවක් විය.

අතලොස්සක් හැර අනෙත් ජනපද
වාසින් රාමන් හා විසුවේ සමීප
සබඳකමකින්ය. ඔහු රියට නැගුන
වේලාවේ සිට පුංචිබණ්ඩේගේ පවුලේ
අය ගැන සිතුවේය. සීතාට තම පෙම්
වතාහැර යාම දරා ගත නොහැකි සං
තාපයක් වුවාය. ඈ සෑම මොහොතේම
සෙසු අයට නොදැනෙන පරිදි සිතින්
ඉකිබින්දාය. කමල්ටද සීතා නැතුව
ජීවත් විය නොහැකි බව සිතමින් සිතේ
ගින්න ඉවසා දරා ගන්නට තැත් කලත්
එය ඔහුට අසීරු විය. ඔහු බලාගත්
අත බලාගෙන සිතුවිලි මැද තනිවුවේය.
සීතා කොහේ හරි ගොස් වහා තොරතුරු
දන්වතැයි යන අපේක්ෂාවෙන් ඔහු
සිටියත් මාසයක් දෙකක් අවුරුදු හයක්
වනතෙක් කිසිම ඔවුන් ගැන ආරංචියක්
නොලැබුනි. ඒ නිසා කමල් පිස්සෙක්
මෙන් දස දෙස ඇවිදිමින් සීතා සෙවුවේ
එය සැබෑ නොවන සිහිනයක් බව දැන
දැනය. ඔහු නව යොවුන් තරුණයෙක්
නිසා විවාහයක් කරදීමට කමල්ගේ
දෙමව්පියෝ බලවත් උත්සාහයක්
දැරුවෝය. කවදා හෝ සීතා තමාට මුණ
ගැසේවි යන සැඩි බලාපොරොත්තුවෙ
න් ඔහු කල් ගෙවුවේය. ඔහුගේ මල්ලි
නිමල් ජනපදයේ පාසලට පැමිණි
ගුරුවරියක් හා විවාහ වුයේය. කමල්
රජයේ රෝහලක ලිපිකරු තවතුරක්
ලැබ අග නගරයට ආවේය. පුංචිබණ්ඩේ
නිතර දෙවේලේ හිසරදයකින් පෙළී සිටි
නිසා සිංහල, ඉංග්‍රීසි වෙදකම් කලත්
කිසිදු සුවයක් නොලැබුණි. ඒ නිසා ඔහු
කොළඹ ජාතික රෝහලේ නතර කර
සාත්තු කිරීමට කමල් සිතුවේය. තම
මවත් පියාත් කැඳවා ගෙන කුලී නිවසක
තිදෙනා පදිංචි වුහ. ජනපද සියලු ඉඩ
කඩම් කුඹුරු තම මල්ලිට දී ඔහුට එහි
නතර වීමට ඉඩ සැලැස්වීය. පියා රෝහ
ලේ නතර කර වෙදකම් කරද්දි ඔහු මිය
ගියේ සැම සිත් වේදනාවට පත්කරමිනි.
පුංචිබණ්ඩේගේ භූමදාන කටයුතු කලේ
මින්නේරියේය. ජනපද වාසින් ඉමහත්
ශෝකයට පත්කල මරණය ගැන රාමන්
දැන සිටියා නම් මේ අවස්ථාවේ මරණ
කටයුතු වල බර කරට ගන්නේ ඔහු බව
කමල්ට හා නිමල්ට වැටහුනෝය. රාමන්
ඇතුලු ඔහුගේ පවුලේ සැම ජීවිතක්ෂ
යට පත්වෙන්න ඇතැයි සමහරු සිතූහ.

භූමදාන කටයුතු නිමවීමෙන් පසු සිය
මව නිමල් ලඟ නවත්වා කමල් යලි රැ
කියාවට ගියේය. ඔහු සුපරීක්ෂාකාරීව
සීතා ගැන සොයන්නට වෙහෙසක්
ගත්තේය. නමුත් එය නිෂ්ඵල වෑයමක්
බව ඔහුට පෙනින. ඉන්පසු ඔහු ද්‍රවිඩ
පුවත්පතේ දැන්වීමක් පලකලේ ඔවුන්
සොයා දෙන කෙනෙකුට ත්‍යාගයක්
පිරිනමන බවය. කමල්ගේ සියලු කටයුතු
ගඟට කැපි ඉනි මං වගේ විය. කාලය
තුරඟ වේගයෙන් ඉදිරියට ඇදින. කමල්
තනිකඩ ජීවිතයක් ගෙවමින් සැනසුම්
ලැබුවේය. සිය මව යලිත් කොළඹට
කැඳවා ගෙන ආවාය. ආලය කියන
දහමට රැවටුන කමල් සිත දඩු අඩු
වකට අසු වුවා සේ කල්ගත කළේය.

එක්තරා සවසක කමල් පාර හරහා
යාමට රැඳී සිටින විටක, කමල් කමල්
යන රාවය තම කණ වැටින. සුපුරුදු
ලාලිත්‍ය කටහඬක් බව දැනී වට පිට
බැලුවේය. එහෙත් තමා දන්නා හඳුනන
කිසිවෙක් ඒ අවට නොසිටි නිසා ඔහු
පාර හරහා යන්න පියවර තැබුවා. එවිට
යළි එහුගේ නම කියන හඬ ඇසින.
නෙත ගැටෙන මානයේ කෙනෙක් නැති
නිසාත් තම මිතුරන් විහිලුවක් කරනවා
යැයි සිතා ඉදිරියට ඇඳුනේය. දරු
සිගිත්තෙක් අත දරා තලතුනා හැඩි දැඩි
පුද්ගලයෙක් සමඟ කතක් තමා පසු පස
එන බව දැනී ඒ දෙස බැලුවේය. ''කමල්
ඔයාට මාව හඳුනාගන්න බැරිද?
මින්නේරියේ හිටපු සීතා...... 'මොනවා
සීතා, ඔයා කොච්චර හෙව්වද? කෝ
තාත්තා අම්මා රඝු එහෙම'. 'ඒ අය
ඉන්නේ යාපනයේ ධීවර ගම්මානයක.
මේ තමා මගේ පුරුෂයා පෙරුමාල් '.
'හා ඇත්තද' කියා කමල් ඈ දෙස ඇස
පිය නොහෙලා බලා සිටියේ
තුෂ්නිම්භූතවයි.

එදා ඈ වසඟ කළ දඟකාර බැල්මේ
දැන් සංවරශීලි බව රැඳී තිබින. තෙපලු
කෝල වදන් නැත. නීල වරලස සිරසින්
සමුගෙනය. සිහිනිගටිය වංගෙඩියක්
මෙන්ය. කෙසඟ සිරුර තරබාරුය. කුස
කළගෙඩියක් මෙන්ය. වයසට වඩා මහලු
වුත් විරූපීවුත් පෙනුමක් දිස්විය.කාලයේ
අරුමය මෙය දැයි කමල්ට ප්‍රහේලිකා
වකි. අනේ කමල් අප පණ රැක ගත්තේ
මේ පෙරුමාල් නිසා යයි ඈ තම සැමියා
දෙසට නෙත් යැව්වාය.

රඝු ඉගෙන ගන්න මහන්සි වුවේ නැත.
සිදුවු විත්නැහිය නිසා ඔහු ජීවිතය ගැන
කළකිරී දවස් ගත කළේය. දෙමව්පිය
දෙදෙනා ධීවර ගමක ගොස් පැලක
සිටිනවා. අපි ජනපදයෙන් ආ පසු වින්ද
දුක් අපමණය. හෙලු කඳුලු කියා නිම
කළ නොහැක. පෙරුමාල් අපට දෙවිෙ
යක් වගේ උදව් දුන්නා. ජීවත් කරවන්න
අත දුන්නා. ඒ අපට මහත්
අස්වැසිල්ලක් වුවා. ගතවු කාලය තුල
ඇත්තේ දිගු කථාවකි. 'හරි හරි දැන්
අපේ ගෙදරට යමු. මගේ අම්මත් මාත්
ඉන්නේ කොළඹ. එහේ ගිහින්
ඔක්කොම විස්තර දැන ගනිමු'යි කියා
කමල් කුලී රියකින් සීතාත් දරුවාත්

30 වන පිටට